# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
# பொலிஸ் ஊடகப் பிரிவு
# POLICE MEDIA DIVISION

පොලිස් මූලස්ථානය, කොළඹ 01

තැ.පෙ.අංකය / த. பெ.இ / Po.Box No — 10120

ෆැක්ස් / தொலைநகல / Fax — 011-2171635

දුරකථන / தொலைபேசி / Telephone — 011-2887973 (HUNTING)

වෙබ්.ලිපිනය / இணையதளம் / Web Site — www.Police.lk

ඊ මේල් / மின்னஞ்சல் / E-mail — dir.media@police.gov.lk


මගේ අංකය / எனது இலக்கம் / My NO — 781/2024

ඔබේ අංකය / உமது இலக்கம் / Your No — / 2024

දිනය / திகதி / Date — 08/05/2024 පැය 1605

## මාධ්‍ය නිවේදනය

**පොලිස් විශේෂ කාර්ය බලකාය විසින් සිදු කරන ලද වැටලීම් සම්බන්ධ තොරතුරු**

**01. 2024.05.07 වන දින පොලිස් විශේෂ කාර්ය බලකා නිලධාරින් විසින් සිදු කරන ලද නීති විරෝධී මත්පැන් වැටලීම් සම්බන්ධ වාර්තාව පහත පරිදි වේ.**

| වැටලීම් ගණන | අත්අඩංගුවට ගත් සැකකරුවන් ගණන | නීති විරෝධී මත්පැන් ප්‍රමාණය (ලීටර්) | ගෝඩා ප්‍රමාණය (ලීටර්) | වෙනත් දේපල |
|---|---|---|---|---|
| 03 | 03 | 15 | 52 | දඟර 01<br>බාල්දි 01 |

වැටලීම් සිදු කර අත්අඩංගුවට ගන්නා ලද සැකකරුවන් හා දේපල අදාළ පොලිස් ස්ථාන වෙත ඉදිරිපත් කර ඇත.

**02. මෙරට නිෂ්පාදිත ගිනි අවියක් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා දඹුල්ල කඳවුර.**

2024.05.07 වන දින උදෑසන කාලයේ පොලිස් විශේෂ කාර්ය බලකා දඹුල්ල කඳවුරේ නිලධාරීන්ට ලද තොරතුරක් මත දඹුල්ල පොලිස් වසමේ අලකොල වැව ප්‍රදේශයේ දී වැටලීමක් සිදු කර **මෙරට නිෂ්පාදිත ගිනි අවියක් සමඟ සැකකරුවෙකු** අත්අඩංගුවට ගෙන දඹුල්ල පොලිස් ස්ථානයට භාර දී ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස 19 ක් වූ දඹුල්ල ප්‍රදේශයේ පදිංචිකරුවෙකු වේ.** දඹුල්ල පොලිසිය වැඩිදුර විමර්ශන පවත්වාගෙන යනු ලබයි.

**03. මෙරට නිෂ්පාදිත ගිනි අවියක් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා අරන්තලාව කඳවුර.**

2024.05.07 වන දින දහවල් කාලයේ පොලිස් විශේෂ කාර්ය බලකා බලකා අරන්තලාව කඳවුරේ නිලධාරීන්ට ලද තොරතුරක් මත මහඔය පොලිස් වසමේ කලුපැනි ප්‍රදේශයේ දී වැටලීමක් සිදු කර **මෙරට නිෂ්පාදිත ගිනි අවියක් සමඟ සැකකරුවෙකු** අත්අඩංගුවට ගෙන මහඔය පොලිස් ස්ථානයට භාර දී ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස 56 ක් වූ කැකිරිහේන ප්‍රදේශයේ පදිංචිකරුවෙකු වේ. මහඔය** වැඩිදුර විමර්ශන පවත්වාගෙන යනු ලබයි.

**04. මත්කරල් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා යාපනය කඳවුර.**

2024.05.07 වන දින දහවල් කාලයේ පොලිස් විශේෂ කාර්ය බලකා විශේෂ කාර්ය බලකා යාපනය කඳවුරේ නිලධාරීන්ට ලද තොරතුරක් මත යාපනය පොලිස් වසමේ පෞද්ගලික බස් නැවතුම්පොල ප්‍රදේශයේ දී වැටලීමක් සිදු කර **මත්කරල් 70 ක් සමඟ සැකකරුවෙකු** අත්අඩංගුවට ගෙන යාපනය පොලිස් ස්ථානයට භාර දී ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස 19 ක් වූ යාපනය ප්‍රදේශයේ පදිංචිකරුවෙකු වේ. යාපනය** වැඩිදුර විමර්ශන පවත්වාගෙන යනු ලබයි.

**05. රක්ෂිතයකට ඇතුළු වී දැව කපමින් සිටි සැකකරුවන් දෙදෙනෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා මුලතිව් කඳවුර**

2024.05.07 වන දින සවස් කාලයේ පොලිස් විශේෂ කාර්ය බලකා මුලතිව් කඳවුරේ නිලධාරීන්ට ලද තොරතුරක් මත පුදුකුඩිඉරිප්පු පොලිස් වසමේ පාවඩුකල්ලාර රක්ෂිත ප්‍රදේශයේ දී වැටලීමක් සිදු කර **චේන්සෝ යන්ත්‍ර 02 ක් මඟින් දැව කපමින් සිටි සැකකරුවන් දෙදෙනෙකු** අත්අඩංගුවට ගෙන පුදුකුඩිඉරිප්පු වන සංරක්ෂණ කාර්යාලයට භාර දී ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරුවන් අවුරුදු 21 හා 44 වයස් වල පසුවන උඩයාර්කට්ටු උතුර හා පුදුකුඩිඉරිප්පු ප්‍රදේශ වල පදිංචිකරුවන් වේ.**

**06. බලපත්‍ර කොන්දේසි උල්ලංඝණය කර ටිපර් රථයකින් වැලි ප්‍රවාහනය කරමින් සිටි සැකකරුවකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා කිලිනොච්චිය කඳවුර**

2024.05.07 වන දින දහවල් කාලයේ පොලිස් විශේෂ කාර්ය බලකා කිලිනොච්චිය කඳවුරේ නිලධාරීන්ට ලද තොරතුරක් මත ධර්මපුරම් පොලිස් වසමේ 13 කණුව ප්‍රදේශයේ දී වැටලීමක් සිදු කර **බලපත්‍ර කොන්දේසි උල්ලංඝණය කර ටිපර් රථයකින් වැලි ප්‍රවාහනය කරමින් සිටි සැකකරුවෙකු** අත්අඩංගුවට ගෙන වැඩිදුර විමර්ශන සඳහා ධර්මපුරම් පොලිස් ස්ථානයට භාර දී ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 34 ක් වූ වාවකච්චේරි ප්‍රදේශයේ පදිංචිකරුවෙකු වේ.**

මාධ්‍ය ප්‍රකාශක කාර්යාලය
පොලිස් මාධ්‍ය කොට්ඨාසය.